**අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

# කාර්යාලීය ගොඩනැගිලි බදු කුලී පදනමින් ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ බස්නාහිර පළාත් පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා මතුගම කාර්යාලයට ආසන්නයේ පිහිටි වර්ග අඩි 7500 ක පමණ ඉඩකඩ පහසුකම්වලින් යුතු පුහුණු මධ්‍යස්ථානයකට සුදුසු ගොඩනැගිල්ලක් බදු පදනම මත ලබා ගැනීම සඳහා කෙරෙන විවෘත මිල ගණන් කැඳවීමයි.

**ගොඩනැගිලි සම්බන්ධයෙන් සපුරාලිය යුතු සුදුසුකම්.**

**දේශන ශාලා**

- එක් පුහුණු පාඨමාලාවක් සඳහා පුහුණුලාභීන් 45 පමණ සහභාගි කරවීමට හැකි පංති කාමර 10 ක් පමණ සහිත ගොඩනැගිල්ලක් විය යුතුය.

**කාර්යාල පරිශ්‍රය**

- කාර්ය මණ්ඩලය සඳහා වර්ග අඩි 500 පමණ ශාලාවක් තිබිය යුතුය.
- පුහුණු උපකරණ තබා ගැනීම (Lab) සඳහා වර්ග අඩි 400 ප්‍රමාණයේ කාමර 05 ක් තිබිය යුතුය.
- ආරක්ෂක කුටියක් ඉදිකිරීම සඳහා කාර්යාල පරිශ්‍රයේ ඇතුළතින් ගේට්ටුවට ආසන්නයේ ඉඩ පහසුකම් තිබිය යුතුය.
- පුහුණු මධස්ථානය වටේට ගේට්ටුව සහිත තාප්පයක් තිබිය යුතුය.
- අවම වශයෙන් දෛනිකව වාහන 10 –15 ක් පමණ ගාල් කිරීමට ඉඩ පහසුකම් තිබිය යුතුය.
- කාර්ය මණ්ඩලයට හා බාහිර පාර්ශවයන්ට භාවිතා කිරීම සඳහා වැසිකිළි 06 ක් පමණ වෙන් වෙන්ව තිබිය යුතුය.
- සේවා ලබා ගැනීමට පැමිණෙන සේවාලාභීන් 20 කට පමණ එකවර අසුන් ගෙන තම රාජකාරී සේවාව ඉටු කර ගැනීම සඳහා ඉඩ පහසුකම් ගොඩනැගිල්ල ඇතුළත තිබිය යුතුය.
- සෘජු ජල නළ සම්බන්ධතාවයක් සමග වෙන්වූ ජල මීටරයක් තිබිය යුතු අතර ගොඩනැගිල්ලට ජලය ලීටර 2000 L පමණ ගබඩා කර තැබිය හැකි ජල ටැංකියක්/ ටැංකිවලින් සමන්විය යුතුය.
- මෙම ගොඩනැගිල්ල පොදු ප්‍රවාහන පහසුකම් භාවිතා කර පහසුවෙන් ළඟා විය හැකි වාණිජමය ප්‍රදේශයක් තුළ පිහිටා තිබිය යුතුය.
- තෙකලා විදුලි සැපයුමක් සමග වෙන්වූ විදුලි මීටරයක් තිබිය යුතු අතර, විදුලිය විසන්ධි වූ අවස්ථාවක භාවිතා කිරීමට විදුලි ජනක යන්ත්‍රයක් තිබීම අමතර සුදුසුකමක් වේ.
- ස්ථාවර දුරකථන පහසුකම් තිබීම අමතර සුදුසුකමක් වේ.
- ප්‍රධාන විදුලිය බෙදාහැරීමේ පුවරුව සහිත මූලික විදුලි පරිපථ පද්ධතිය විදුලි පංකා හා අනෙකුත් උපාංගවලින් සමන්විත විය යුතුය.
- ස්ථානය තෝරාගත් බව දැනුම් දීමෙන් පසු ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම වැඩ නිම කර සති 2ක් ඇතුළත ලබාගැනීමේ හැකියාව පැවතිය යුතුය.
- අප ජලය හා මළ අපවහන ක්‍රමවේදය විධිමත් පරිදි සකස් කළ ගොඩනැගිල්ලක් විය යුතුය. පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වන බැවින් මළ අපවාහන පද්ධතියේ ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත්ම විය යුතුය.
- කාමර කොටස් කර ගැනීම කාර්යාංශයට අවශ්‍ය පරිදි සිදු කර ගත හැකි විය යුතුය.
- හදිසි අවස්ථාවක දී ගොඩනැගිල්ලෙන් පිටතට යාම සඳහා ක්‍රමවේදයක් සහ දොරටු තිබිය යුතුය
- කාර්යාලය පවත්වා ගෙන යාම නිසා අදාළ ගොඩනැගිල්ල පිහිටි ප්‍රදේශය අවට පදිංචිකරුවන්ට කිසිදු අවහිරතාවයක් නොවන හා අවට පදිංචිකරුවන් ගෙන් කාර්යාල කටයුතු වලට බාධා නොවන ස්ථානයක් විය යුතුය.
- ගොඩනැගිලි පරිශ්‍රය වායු සමීකරණය කර හා අඛණ්ඩ ජල සැපයුම තිබිය යුතුය.
- මල්ටිමීඩියා පහසුකම්, ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීමට පහසුකම් තිබිය යුතුය.
- ගොඩනැගිල්ල තුළ ගිනි නිවීමේ පද්ධතියක් ස්ථාපිත කර තිබිය යුතු අතර, හදිසි ආපදා තත්ත්වයකදී ගිනි නිවීමේ රථ හා සහන කණ්ඩායම් සඳහා පහසුවෙන් ළඟා විය හැකි ස්ථානයක පිහිටා තිබිය යුතුය.
- නිලධාරීන් සඳහා නේවාසික පහසුකම් ලබාගතහැකි අයුරින් වෙන්වූ කාමර දෙකක් හෝ කීපයක් වැසිකිළි පහසුකම් සහිතව ගොඩනැගිලි තුළ පිහිටීම හා ඒ සඳහා වෙන්වූ ඇතුළුවීමේ දොරටුවක් තිබීම හෝ මෙම පරිශ්‍රයේම මේ සඳහා ගොඩනැගිල්ලක් පිහිටීම අමතර සුදුසුකමක් වේ.
- බදු දීමනාකරු විසින් සඳහන් කර ඇති මාසික කුලී මුදල රජයේ තක්සේරු වාර්තාවට යටත්ව ගෙවීම් සිදු කරනු ලබයි.(අවම මුදල)

**ගොඩනැගිලි හිමිකරු විසින් මෙහි සඳහන් ලියකියවිලිවල පිටපත් ඉදිරිපත් කළ යුතුය.**

01. මිල ගණන් පත සමග කාර්යංශය ලබා දෙන ලංසු ලේඛණය.
02. මාසික බදු මුදල සඳහන් ලිපියක් .
03. බද්දට අදාළ දේපළේ නිශ්චිත ලිපිනය.
04. ගොඩනැගිලි හිමිකරු අයිතිවාසිකම් ලබාගත් ඔප්පුවෙහි සහතික කරන ලද පිටපතක් හා ඊට අදාළ පත්ඉරු.
05. දේපළට අදාළ පිඹුරුපත.
06. සහතික කරන ලද අනුමත ගොඩනැගිලි සැලැස්ම (අදාළ ගොඩනැගිලි සැලැස්මA4 ප්‍රමාණයේ හෝ A3 ප්‍රමාණයන්ට කුඩා කර ලබාගත් ඡායා පිටපතක් විය යුතුය).
07. බදු දීමනාකරුගේ නම/ලිපිනය/ජාතික හැඳුනුම්පත් අංකය හා එහි පැහැදිලි ඡායා පිටපතක්.
08. ගොඩනැගිලි හිමිකරුගේ දුරකතන අංකය.
09. අනුකූලතා සහතිකය
10. පසුගිය මාස 06 ඇතුළත ලබාගත් විදුලි, දුරකතන, වරිපනම් ආදී බිල්පත්වල පිටපත්
11. බදු දීමට අපේක්ෂිත අදාළ දේපළ සඳහා හිමිකම් වාර්තාවක් පෙළපතත් සමග ඉදිරිපත් කළ යුතු අතර, එය ප්‍රදේශයේ නීතීඥවරයෙකු ලවා පිළියෙළ කර අවසානයේ ඔහුගේ නිර්දේශයද සහිතව ඉදිරිපත් කළ යුතුය.

ලංසුපත් බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක. 234 හි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දෙවන මහලේ පිහිටි ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට 2024.11.26 .දින ප.ව 01.00 ට හෝ ඊට පෙර බහාලිය යුතුය. ඔබගේ ඉල්ලුම්පත බහාලන කවරයේ වම් කෙලවරේ ඉහළින් "ගොඩනැගිලි කුලී පදනම මත / බදු පදනමට යටත්ව ප්‍රසම්පාදනය කිරීම. PR/02/04- 01(86) යනුවෙන් සඳහන් කළ යුතුය.

කිසියම් අයදුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමේ හෝ භාර ගැනීමේ අයිතිය කාර්යාංශයේ ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ. රජයේ තක්සේරු කරුගේ වාර්තා වලට යටත්ව ගෙවීම් සිදු කරණු ලැබේ. ආපසු නොගෙවන රුපියල් 1000.00 ක මුදලක් ප්‍රධාන කාර්යාලයේ මුදල් අයකැමි වෙත ගෙවා ලබා ගත් කුවිතාන්සිය කළමනාකරු-ප්‍රසම්පාදන වෙත ඉදිරිපත් කර ලංසු ලේඛණ ලබාගත හැකිය. (මුදල් ගෙවීමට ආයතන ලිපි ශීර්ෂයෙහි කරන ලද ලිඛිත ඉල්ලීමක් සහිතව පැමිණිය යුතුය) ලංසු ලේඛණ 2024.11.04 දින සිට 2024.11.25 දක්වා කාර්යාලීය වේලාව තුළදී (පෙ.ව.9.00 – ප.ව.03.00 අතර කාලය) ලබාගත හැක.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල.**
**දුරකථන/ ෆැක්ස් : 2880550/ 2887585**
**වෙබ් අඩවිය : www.slbfe.lk**

**එතෙර සවියට මෙතර අත්වැල**